# Respectful

20
21

Founded in 1998, lululemon's purpose is to elevate the world by realizing the full potential within every one of us. This includes the workers who make our products. The Vendor Code of Ethics outlines our unwavering commitment to contributing to healthy communities by fostering respectful and inclusive workplaces.

This Code is based on international standards, such as the International Labour Organization's Declaration on Fundamental Principles and Rights at Work, the Universal Declaration of Human Rights, the United Nations Guiding Principles, the OECD Due Diligence Guidance for Responsible Supply Chain in the Garment and Footwear sectors and those of the Fair Labor Association, to which we are affiliated as a Participating Company. A commitment to these internationally recognized principles is the starting point.

These are our minimum standards that we expect all of our Vendors to comply with, and we will work with our Vendor partners to ensure they are upheld. Requirements in this Code apply to owned facilities as well as subcontractors, and upstream suppliers. Where differences or conflicts in standards arise between this Code and national or local regulations, the strictest standard applies.

This Code is complemented by compliance benchmarks. If we find that a Vendor is not in compliance with this Code and benchmarks, we will require immediate attention to corrective action. Compliance with the Vendor Code of Ethics is a condition to start and maintain a business relationship with lululemon.

# අවංක ගෞරවාන්විත ආරක්ෂා සහිත සෞඛ්‍ය සම්පන්න සියළු දෙනා ඇතුළත් විවෘත විනිවිද භාවයෙන් යුතු

## ආරක්ෂිත සහ සෞඛ්‍යමත් සේවකයින් සහ ප්‍රජාවන්

### සෞඛ්‍යය සහ ආරක්ෂාව

සැපයුම්කරු විසින් වැඩ කාර්යයන් හේතුවෙන්, ඒවාට සම්බන්ධිතව, හෝ ව්‍යාපාරිකයාගේ ආයතනවල මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස සේවකයින්ට මුහුණ දීමට සිදු වන හදිසි අනතුරු හෝ ඔවුන්ගේ සෞඛ්‍යයට හානි සිදුවීම් වළක්වා ගැනීම පිණිස ආරක්ෂිත සහ සෞඛ්‍යමත් සේවා ස්ථානයක් සහ නේවාසික පරිසරයක් ලබා දිය යුතුය. සේවකයන් හට ප්‍රමාණවත් සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ පුහුණුවක් ලබා දිය යුතු අතර, ඔවුනට පිරිසිදු වැසිකිළි පහසුකම් සහ පානීය ජලය, පිරිසිදු සහ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපිරෙන ආකාරයේ ආරක්ෂිත නේවාසික පහසුකම් ලබා දිය යුතුය.

### පාරිසරික අනුග්‍රාහකත්වය

සැපයුම්කරු විසින් සිය සේවා ස්ථාන මඟින් පරිසරය සහ අවට ප්‍රජාවන් වෙත සිදු කෙරෙන අහිතකර බලපෑම් අවම කිරීමට කටයුතු කළ යුතු අතර, lululemon ව්‍යාපාර පාරිසරික අත්පොතේ දක්වා ඇති ආකාරයට සිය සේවා ස්ථානවල භාවිතා කෙරෙන රසායනික ද්‍රව්‍ය සහ ඒවායින් ජනනය කෙරෙන අපජලය කළමනාකරණය කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මක කළ යුතුය.

## අවංක සන්නිවේදනය

### විවෘත විනිවිද භාවය සහ සහයෝගීතාව

සැපයුම්කරු සහ lululemon, මෙහෙයුම් කටයුතුවලින් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට සහ සේවකයන්ගේ ජීවිතවලට, පරිසරයට, හෝ අවට ප්‍රජාවන්ට බලපෑ හැකි ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා නිත්‍ය පදනමකින් සහාය දැක්වීම සහ එවැනි කටයුතුවල ක්‍රියාකාරී ලෙස සහයෝගිතාවයෙන් නිරත විය යුතු වේ. . සැපයුම්කරු විසින් අනවසර උප කොන්ත්‍රාත්තුගත කිරීම හෝ ගෘහ සේවය භාවිතා නොකළ යුතු අතර,කිසියම් විගණන හෝ විමර්ශනවලට සම්පූර්ණයෙන්ම සහාය දැක්වීම පිණිස, lululemon හෝ එහි තෙවන පාර්ශ්වයක නියෝජිතයන් හට ප්‍රවේශය ලබා දිය යුතුය.

### සාධාරණව කටයුතු කිරීම

සැපයුම්කරු විසින්, අසාධාරණ අයකිරීම්, අල්ලස්, හෝ වෙනත් කිසියම් ආකාරයක වාසියක් ලබා ගැනීම සඳහා බලය අනිසි ලෙස භාවිතා කිරීම් ඇතුළුව සියලු ආකාරයේ දූෂණයන් වළක්වා ගත යුතුය.

### ඵලදායී දුක්ගැනවිලි යාන්ත්‍රණ

සැපයුම්කරු විසින් සේවාස්ථානයේ දුක් ගැනවිලි රහස්‍ය ලෙස, නිර්නාමිකව, සහ/හෝ ඍජු ලෙස, එකට එක කිරීම් හෝ පළිගැනීම්වලින් තොරව, ඉස්මතු කිරීමට ඉඩ සැලසෙන කාර්යපටිපාටි ස්ථාපිත කළ යුතුය. අදාළ කාර්යපටිපාටිය සියලු සේවකයන් වෙත පැහැදිලිව සන්නිවේදනය කළ යුතුය. සේවකයන්ගේ ගැටලුවලට ව්‍යාපාරිකයන් කඩිනමින් ප්‍රතිචාර දැක්විය යුතුය.

### සේවකයන් දැනුවත් කිරීම

සැපයුම්කරු විසින් මෙම ආචාරධර්ම සංග්‍රහය සේවකයන්ගේ භාෂාවෙන්/භාෂාවලින් සියලු ප්‍රධාන සේවා ස්ථානවල, නේවාසිකාගාරවල ප්‍රදර්ශනය කළ යුතු අතර, එහි අන්තර්ගත සම්බන්ධයෙන් සේවකයින් පුහුණු කළ යුතුය.

## ගෞරවණීය සහ සියලු දේවලින් අනූන සේවාස්ථාන

### ළමා ශ්‍රමය භාවිතා නොකළ යුතුය

සැපයුම්කරු විසින්, අවම වශයෙන් අවුරුදු 15ට අඩු, අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ වයස, හෝ දේශීය නෛතික වැඩ කිරීමේ වයස, යන මේවායින් ඉහළම නිර්ණායකයට අඩු වයස්කරුවන් සේවානියුක්ත කිරීම නොකළ යුතුය. අවුරුදු 18ට අඩු ඕනෑම සේවකයෙකු අතිකාල වැඩ කිරීමෙන්, රාත්‍රී සේවාමුරවලින්, අනතුරුදායක වැඩවලින් ආරක්ෂා කළ යුතු අතර, ඔවුන් වෙත පවරනු ලබන කාර්යයන් නෛතික නියමයන් සහ මනා පරිචයන් විසින් නියම කරනු ලබන සීමාවන්ට ගරු කරමින් සිදු කළ යුතුය.

### හිංසන, අපහරණය සහ විනයානුකූල ක්‍රියාමාර්ග

සැපයුම්කරු විසින් සෑම අයෙකුටම ගෞරවයෙන් සහ අභිමානයෙන් සැලකිය යුතුය. සේවා ස්ථානය තුළ වාචික, මානසික, කායික, හෝ ලිංගික හිංසන, අපහරණය, තර්ජන, හෝ බියවැද්දීම් සඳහා කිසිදු ඉඩක් නොතැබිය යුතුය.

### වැටුප්,වේතන සහ ප්‍රතිලාභ

සැපයුම්කරු විසින් සෑම සේවකයෙකුටම නිත්‍ය වැඩ සතියක් /පරිච්ඡේදයක් සඳහා සිය මූලික අවශ්‍යතා සැපිරීමට සහ සියලු මූලික වියදම් දැරීමෙන් පසුව කිසියම් ඉතිරි කිරීමක් සිදු කර ගැනීමට තරම් ප්‍රමාණවත් ගෙවීමක් ලැබීම සඳහා ඇති අයිතිය පිළිගත යුතුය. සේවකයින් හට අඩුම වශයෙන් අවම වැටුප හෝ යෝග්‍ය ප්‍රවර්තන වැටුප, යන මේ දෙකෙන් ඉහළ වැටුප ලබා දිය යුතු අතර අතිකාල සඳහා අදාල ප්‍රතිශතයන් යටතේ ගෙවීම් කළ යුතුය. වැටුප් සම්බන්ධයෙන් වන සියලු නෛතික නියාමනයන්වලට සැපයුම්කරු අනුකූලව කටයුතු කළ යුතු අතර, නීතිය, ගිවිසුම, හෝ ගෝලීය මනා පරිචය අනුව සියලු ප්‍රතිලාභ ලබා දිය යුතුය. ගෙවීම්වලින් සේවකයින්ගේ මූලික අවශ්‍යතා සහ යම් ඉතිරි කිරීමක් සිදු කිරීමේ අවශ්‍යතාව නොසැපිරෙන විට, එම අවශ්‍යතා ඉටු කර ගත හැකි මට්ටමේ ගෙවීමක් ගැන අඛණ්ඩ වටහා ගැනීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමට සැපයුම්කරු විසින් lululemon සමඟ කටයුතු කළ යුතුය. සේවිකාවන් හට මාතෘ ආරක්ෂණය සඳහා අදාළ හිමිකම් - එනම් නිවාඩු සහ ප්‍රතිලාභ මෙන්ම වෙනස් ආකාරයට සැලකීම්වලින් ආරක්ෂාව – ජාතික නීති සහ රෙගුලාසි අනුව ලබා දිය යුතුය

### සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ නිදහස

සැපයුම්කරු විසින් ඔවුන්ගේ කිසිදු මැදිහත්වීමකින් තොරව සේවකයින් හට සිය කැමැත්ත පරිදි සංගම්වලට සම්බන්ධ වීමට සහ සංවිධානය කිරීමට මෙන්ම සාමූහිකව කේවල් කිරීම සඳහා වන අයිතිය පිළිගෙන ඊට ගරු කළ යුතුය. සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීම නීතිය යටතේ සීමා කර ඇති විට, සැපයුම්කරු විසින් ස්වාධීන සහ නිදහස් සංගම් සහ සාමූහික කේවල් කිරීම සඳහා වන සමාන්තර ආකාරයන් සංවර්ධනය සඳහා අනුග්‍රහය දැක්විය යුතු අතර ඒවාට බාධා කිරීම් නොකළ යුතුය.

### සේවානියුක්තික සම්බන්ධතාවය

සැපයුම්කරු විසින් සේවානියුක්තික නීති සහ කොන්දේසිවලට අනුකූලව, සේවකයින් හට ගරු කරන අතර, අවම වශයෙන්, ජාතික සහ අන්තර්ජාතික කම්කරු සහ සමාජ ආරක්ෂණ නීති සහ රෙගුලාසි යටතේ ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කළ යුතුය.

### සේවානියුක්තිය නිදහසේ තෝරා ගනු ලැබීම

සැපයුම්කරු විසින් බඳවා ගැනීමේදී, රැකියාව සඳහා තෝරා ගැනීමේදී, හෝ සේවා නියුක්ත කරවීමේදී බලහත්කාර ශ්‍රමය භාවිතා නොකළ යුතු අතර, ඊට සිය කැමැත්තෙන් නොවන අතිකාල, මිනිස් ජාවාරම, බන්ධනාගාර ශ්‍රමය, ගිවිසුම්ගත වහල්භාවය, හෝ බැඳුම්ගත ශ්‍රමය ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

### වෙනස් ආකාරයට නොසැලකීම

සැපයුම්කරු විසින්, බඳවා ගැනීමේදී සහ සේවානියුක්තික පරිචයන්හිදී වෙනස් ආකාරයට සැලකීම් නොකළ යුතුය. සියලු සේවකයින් හට බඳවා ගැනීම, වැටුප්, ප්‍රතිලාභ, උසස් කිරීම්, පුහුණුව, වැඩ වෙන් කිරීම, හෝ විශ්‍රාම ගැන්වීම ඇතුළු දේවල් සඳහා සමාන ප්‍රවේශයක් ලබා දිය යුතු අතර, ඔවුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂභාවය, ලිංගික අනන්‍යතාවය, ආගම, ජාතිය, වෛවාහික තත්ත්වය, ජාතික සම්භවය, කුළය, ලිංගික නැඹුරුව, ආබාධිතභාවය, රෝගාබාධ, ගර්භණීභාවය, වයස, භාෂාව, සමාජ සම්භවය, සංක්‍රමණික තත්ත්වය, වෘත්තීය සමිති, දේශපාලන අනුබද්ධ ආයතන හෝ විශ්වාස ඇතුළත් සංවිධානවල සාමාජිකත්වය හෝ සානුකම්පාව, වෙනත් කිසියම් පුද්ගලික චරිත ලක්ෂණ, සමාජ කණ්ඩායම්, ආරක්ෂිත තත්ත්වය, හෝ වෙනත් කිසියම් තත්ත්වයක් කුමක් වුවත් ඔවුන් කිසිදු වෙනස් ආකාරයක සැලකීමකට භාජනය නොකළ යුතුය.

### වැඩ කරන පැය ගණන සහ අතිකාල

සැපයුම්කරු විසින් සේවකයන්ට පැය 48කට වඩා වැඩ කිරීමට නිත්‍ය වැඩ සතියක් නියම නොකළ යුතුය. සියලු අතිකාල වැඩ සිය කැමැත්තෙ න්සහ, අදාල ප්‍රතිශතයන්ගෙන් ගෙවීම් සිදු කළ යුතු අතර, නිත්‍ය පදනමක් මත අතිකාල වැඩ කරන ලෙස ඉල්ලා නොසිටිය යුතුය. ව්‍යාපාරිකයා විසින් අවම වශයෙන් සෑම දින හතේ කාල සීමාවකදී අඛණ්ඩ පැය 24 විවේක දිනයක් මෙන්ම, ව්‍යවස්ථාපිත නිවාඩු සහ අනෙකුත් නිවාඩු ලබා දිය යුතුය. අසාමාන්‍ය තත්ත්වයන් යටතේ හැර, අතිකාලද ඇතුළුව, සේවකයින්ගේ වැඩ කරන පැය ගණන්, සතියකට පැය 60 හෝ දේශීය නෛතික සීමාව, යන මේ දෙකෙන් අඩු සීමාව ඉක්මවා නොයන බවට වග බලා ගත යුතුය. ජාතික නීති සහ රෙගුලාසි අනුව විවේක වේලාවන්වලට ගරු කළ යුතුය.

**මෙම සංග්‍රහය සමඟ සේවා ස්ථානයේ අනුකූලවීමක් ඇති නොවුණ වුවහොත් කරුණාකර ඔබ කැමති භාෂාවකින් ඍජුව අප හා sustainablepartner@lululemon.com ඔස්සේ සම්බන්ධ වන්න.**